
# Project 34
# 34 වන ව්‍යාපෘතිය




DP EDUCATION

## Coding School




LIVEWORKSHEETS

# MP3 Player ඇප් එකක් නිර්මාණය කිරීම

ඉහතින් ඇති How It Works ලින්ක් එක විවෘත කරගෙන </> View code කලික් කරන්න.

දැන් Remix කලික් කරන්න. Rename මගින් ඔබේ නම යොදා Save කරගන්න.

මෙම ඇප් එක නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන ස්ක්‍රීන් 6 ක් අප විසින් යොදා ඇත.




startScreen




screen2




screen3




Screen4




screen5





screen6

startScreen එකෙහි භාවිතා වන්නේ මෙම MENU MENU Button එක පමණි.

LIVEWORKSHEETS

අනෙක් සෑම screen එකක ම රූපයේ පරිදි Button 5 බැගින් යොදා ඇත. අදාල screen එක අනුව සෑම Button එකක් ම පහසුවෙන් හඳුනාගත හැකි පරිදි නම්කර ඇත. (රූපයේ දැක්වෙන්නේ screen2 හි ඇති Buttons ය.)




**up** Button - ලයිස්තුවේ කලින් ඇති ගීතය තේරීමට.

**down** Button - ලයිස්තුවේ පසුව ඇති ගීතය තේරීමට.

**play** Button - තෝරාගත් ගීතය වාදනය කිරීමට.


**stop** Button - වාදනය වන ගීතය නතර කිරීමට.

**home** Button - මුල පිටුව (startScreen) වෙත යාමට.

මීට අමතරව display ලෙස නම්කළ සජීවිකරණ රූපයක් (Animated gif) යොදා ඇත. ගීතය වාදනය වන විට පමණක් එය දර්ශනය විය යුතුය.

startScreen තුළ භාවිතා කරන්නේ MENU Button එක පමණක් බැවින්, පහත දැක්වෙන බ්ලොක්ස් ඒ සඳහා යොදා ඇත.

```
//startScreen
onEvent("menu1", "click", function( ) {
  setScreen("screen2");
});
```




**Menu1** Button කලික් කළ විට screen2 වෙත යා යුතුයි

LIVEWORKSHEETS

screen2 සඳහා යොදා ඇති බ්ලොක්ස් හඳුනා ගනිමු.

```
// screen2
hideElement("display2");
onEvent("play2", "click", function( ) {
  playSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3", false);
  showElement("display2");
});
```

ආරම්භයේදීම display2 රූපය නොපෙන්විය යුතුයි

**play** Button එක ක්ලික් කළ විට ගීත ලයිස්තුවේ මතුකර පෙන්වා ඇති ගීතය වාදනය විය යුතුයි

ගීතය වාදනය වන විට **display2** සජීවීකරණ රූපය දර්ශනය විය යුතුයි

```
onEvent("stop2", "click", function( ) {
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3");
  hideElement("display2");
});
```

**stop** Button එක ක්ලික් කළ විට වාදනය වෙමින් තිබූ ගීතය වාදනයවීම නතර විය යුතුයි

display2 රූපය නොපෙන්විය යුතුයි

```
onEvent("home2", "click", function( )
  setScreen("startScreen");
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-S
  hideElement("display2");
});
```

**home** Button එක ක්ලික් කළ විට මුල පිටුව (startScreen) වෙත යා යුතුයි

වාදනය වෙමින් තිබූ ගීතය වාදනයවීම නතර විය යුතුයි

display2 රූපය නොපෙන්විය යුතුයි


```
onEvent("down2", "click", function( )
  setScreen("screen3");
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-
  hideElement("display2");
});
```

**down** Button එක ක්ලික් කළ විට තුන්වන පිටුවට (screen3) වෙත යා යුතුයි

වාදනය වෙමින් තිබූ ගීතය වාදනයවීම නතර විය යුතුයි

display2 රූපය නොපෙන්විය යුතුයි

LIVEWORKSHEETS




මේ ආකාරයට ඉතිරි screen සඳහා ද බ්ලොක්ස් සැකසිය යුතුයි.

මෙහිදී screen2 සඳහා යොදා ඇති බ්ලොක්ස් වලට අදාල කෝඩ් ඇසුරෙන් පහසු ක්‍රමයක් හඳුනාගමු.

- දකුණුපස ඉහළින් ඇති `</> Show Text` ක්ලික් කරන්න.
- screen2 සඳහා යොදා ඇති බ්ලොක්ස් වලට අදාල කෝඩ් හඳුනාගන්න. මේ සඳහා `// screen2` ලෙස යොදා ඇති කමෙන්ට් එක වැදගත් වේ.

මේ ආකාරයට පහතින් දක්වා ඇති කෝඩ්ස් තෝරා කොපි කරගන්න.

```
// screen2
hideElement("display2");
onEvent("play2", "click", function( ) {
  playSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3", false);
  showElement("display2");
});
onEvent("stop2", "click", function( ) {
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3");
  hideElement("display2");
});
onEvent("home2", "click", function( ) {
  setScreen("startScreen");
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3");
  hideElement("display2");
});
onEvent("down2", "click", function( ) {
  setScreen("screen3");
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3");
  hideElement("display2");
});
onEvent("up2", "click", function( ) {
  setScreen("screen6");
  stopSound("Yoma-Budu-Netha-Nidukanane-Sunil.mp3");
  hideElement("display2");
});
```

LIVEWORKSHEETS


4 වෙනි පේලියේ සිට 28 වෙනි පේලිය දක්වා ඇති කෝඩ්ස් කොපි කරගැනීමෙන් පසු, පහතින් 29 පේලියේ කලික් කර Paste (පිටපත්) කරන්න.

```
29  // screen3
30  hideElement("display3");
31  onEvent("play3", "click", function
32    playSound("Labunath-Neth-Yuga-As
33    showElement("display3");
34  });
35  onEvent("stop3", "click", function( ) {
36    stopSound("Labunath-Neth-Yuga-Asanka-Priyam.mp3");
37    hideElement("display3");
38  });
39  onEvent("home3", "click", function( ) {
40    setScreen("startScreen");
41    stopSound("Labunath-Neth-Yuga-Asanka-Priyam.mp3");
42    hideElement("display3");
43  });
44  onEvent("down3", "click", function( ) {
45    setScreen("screen4");
46    stopSound("Labunath-Neth-Yuga-Asanka-Priyam.mp3");
47    hideElement("display3");
48  });
49  onEvent("up3", "click", function( ) {
50    setScreen("screen2");
51    stopSound("Labunath-Neth-Yuga-Asanka-Priyam.mp3");
52    hideElement("display3");
53  });
```


**මේ ආකාරයට අංක පමණක් වෙනස් කර අදාල කෝඩ්ස් Button වලට ගැලපිය හැකිය.** ගීතය තේරීම පසුවට තබාගන්න

අංක පමණක් වෙනස් කිරීමෙන් පසුව **Show Blocks** ක්ලික් කර නැවත බ්ලොක්ස් සැකසී ඇති අයුරු බලන්න.

එම තුන්වන පිටුවට අදාල සියළුම බ්ලොක්ස් සඳහා **Labunath Neth Yuga...** ගීතය තෝරා දිය යුතුය. ඒ සඳහා ගීතයේ නමට කලින් ඇති සළකුණ ක්ලික් කර choose තෝරන්න.





Make new sounds තෝරන්න.




LIVEWORKSHEETS

දැන් පිටුවට අදාල නිවැරදි ගීතය තෝරා දෙන්න.




ඉහත ආකාරයට කෝඩ්ස් පිටපත් (Copy&Paste) කර අවශ්‍ය පරිදි වෙනස් (Edit) කිරීමෙන් මෙම ව්‍යාපෘතිය පහසුවෙන් සම්පූර්ණ කළ හැකිය.

LIVEWORKSHEETS